# සබරගමු පළාත් අධ්‍යාපනය දෙපාර්තමේන්තුව

**1 ශ්‍රේණිය (ජූලි 1සතිය)**

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

සැකසුම-කේ.ඩබ්ලිව්.එස්.දර්ශිකා විමලරත්න මෙනවිය,කෑ/දෙහි/ශ්‍රී සීලානන්ද මහා විද්‍යාලය,බුලත්කොහුපිටිය

## <u>දූවේ පුතේ අපි කොස් කොළ ඔටුන්නක් හදාගෙන නැටුමක් නටමු.</u>

- මල්ලකට කොස් කොළ ටිකක් ඇහිඳ ගමු.
- ඉරටු කැබලි ටිකක් ගෙදර අයගේ උදව්වෙන් සොයා ගන්න.

* දැන් කොස් කොළ අරගෙන එක කොස් කොළයක නටුව පැත්තයි අනෙක් කොළයේ ඉදිරිපසයි  එකට තියලා ඉරටුවකින් රඳවා ගන්න.

* මේ සඳහා වැඩිහිටියෙක්ගේ උදවු ලබා ගන්නත් පුළුවන්.

* ඒ විදිහට ඔයාගේ ඔළුව වටේ ගානට වෙනකන් කොස් කොළ එකට අමුණා ගන්න.

* ඊට පස්සේ කොස් කොළ රවුමේ එක තැනකට තව කොස් කොළයක් කෙළින් අතට තියලා රඳවාගෙන ඔටුන්න ලස්සන කර ගන්න.

* ඔටුන්නේ පිටුපසින් ඇමිණූ කොස් කොළ පේළියක් එකතු කරලා කොණ්ඩයක් හදාගන්නත් ඔයාලට පුළුවන්.

* දැන් කොස් කොළ ඔටුන්න දාගෙන ගෙදර අයට බලන්න ලස්සන නැටුමක් නටන්න.